ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
**Ministry of Rural Development, Social Security and Community Empowerment**

01 වන මහල, II අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල. 01ஆம் மாடி, கட்டம் II, செத்சிறிபாய, பத்தரமுல்லை. 01st Floor, Stage II, Sethsiripaya, Battaramulla

මගේ අංකය / எனது இல. / My No: MRDSS&CE/02-01/10/04
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2026.01. 22

චක්‍රලේඛ අංක : 04/2025 (II)

දිස්ත්‍රික් ලේකම්වරුන්

ප්‍රාදේශීය ලේකම්වරුන්

<u>ප්‍රජා සවිබලගැන්වීම් නිලධාරි ආයතනික කටයුතු.</u>

අමප 25/1449/816/060 හා 2025.08.25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය හා අමප 25/2110/816/060 – 1 හා 2025.11.17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ග්‍රාම නිලධාරි කොට්ඨාසය සඳහා ප්‍රජා සවිබලගැන්වීම් නිලධාරීන් අනුයුක්ත කිරීම් ලිපි ලබාදීම සිදු කරන ලදී. ඒ සඳහා ඔබ දක්වන ලද සහය ඉතා අගය කොට සලකමි.

02. එමෙන්ම ප්‍රාදේශීය ලේකම් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා "ප්‍රජාශක්ති" ජාතික වැඩසටහනේ රාජකාරි සිදු කිරීමට ග්‍රාමීය සංවර්ධන කාර්යාංශය යටතේ ප්‍රජා සවිබලගැන්වීම් නිලධාරීන්හට ඔබගේ නිර්දේශ ප්‍රකාර අනුයුක්ත ලිපි නිකුත් කිරීම මේ වන විට සිදු කරමින් පවතී.

03. ප්‍රජා සවිබලගැන්වීම් නිලධාරීන් විෂයෙහි මේ වන විට නිකුත් කර ඇති චක්‍රලේඛ අංක 4/2025 හා 4/2025 (i) ප්‍රකාරව කටයුතු කිරීමේදී පහත කරුණු කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

**03.1 අනුයුක්ත කිරීම.**

03.1.1 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022 හා අනුශාංගික චක්‍රලේඛ යටතේ ග්‍රාම නිලධාරී කොට්ඨාසවල සේවය කර දේශීය / විදේශීය නිවාඩු ලැබ සිටින නිලධාරීන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත කර එම ග්‍රාම නිලධාරී කොට්ඨාස පුරප්පාඩු සේ සලකා එම කොට්ඨාස සඳහා සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කිරීම අත්‍යාවශ්‍ය වේ. එහිදී පූර්ණකාලීනව සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කරමින් මෙම "ප්‍රජාශක්ති" ජාතික වැඩසටහන සාර්ථක කරගැනීමට ඔබගේ සහයෝගය අපේක්ෂා කෙරේ.

03.1.2 එමෙන්ම උක්ත කරුණු හැරුණු කොට මේවන විට ඉල්ලා අස්වී ඇති, සේවය හැරයාම් නිකුත් කර ඇති, වැඩ තහනමට ලක්ව ඇති හෝ වෙනත් යම් හේතුමත ග්‍රාම නිලධාරී කොට්ඨාසයෙන් බැහැර කර ඇති නිලධාරීන් වෙනුවෙන් කාර්යාලගත රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ වන ස්වදේශ කටයුතු අංශයේ සංවර්ධන නිලධාරීන් හෝ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සංවර්ධන නිලධාරීන් අනුයුක්ත

කිරීම සිදු කල හැකිය. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ හා වෙනත් අමාත්‍යාංශ / ආයතන මඟින් ස්ථාන මාරු ලැබ පැමිණීමට අපේක්ෂිත නිලධාරීන් අනුයුක්ත කිරීම සඳහා වන විධිමත් ස්ථාන මාරු කිරීම් එම නිලධාරීන්ගේ කැමැත්ත ප්‍රකාශිත ලිපි හා අදාල අමාත්‍යාංශ / ආයතන වෙතින් නිදහස් කල හැකි බව සඳහන් ලිපිද සමඟ ඉදිරිපත් කල යුතු වේ.

03.1.3 ප්‍රාදේශීය ලේකම් කාර්යාලගතව සැලසුම් අංශය වෙත ප්‍රජා සවිබලගැන්වීම් නිලධාරීන් අනුයුක්ත කිරීමේදීද හැකි සෑම විටම මාස 03කට වඩා අඩු නිවාඩු ලැබ සිටින නිලධාරීන් හැර මේවන විට සේවයේ නිරත වන නිලධාරීන් අනුයුක්ත කිරීම වඩාත් යෝග්‍ය වේ. ප්‍රජා සවිබලගැන්වීම් නිලධාරීන්ගේ කාර්යභාරයට පුළුල් රාජකාරි වපසරියක් ඇතුළත් වන බැවින් සක්‍රිය සේවයේ නියුතු නිලධාරීන්ගේ අවශ්‍යතාවය ප්‍රමුඛ වේ.

03.1.4 මෙහිදීද රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශය යටතේ වන සංවර්ධන නිලධාරීන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු නිලධාරීන් වෙනත් අමාත්‍යාංශ / ආයතන නිලධාරීන් අනුයුක්ත කර ගැනීමේ හැකියාව පවතින අතර ඒ සඳහා විධිමත් ස්ථාන මාරු සඳහා අවශ්‍ය ලේඛන ඉදිරිපත් කල යුතුය.

03.1.5 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සැලසුම් අංශයට ප්‍රජා සවිබලගැන්වීම් නිලධාරීන් අනුයුක්ත කිරීමේදී ග්‍රාමීය සංවර්ධන කාර්යාංශය යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත මේ වන විටත් අනුයුක්තව ඇති සංවර්ධන නිලධාරීන්හට ප්‍රජා සවිබලගැන්වීම් නිලධාරීන් ලෙස අනුයුක්ත ලිපි ලබාදිය යුතුය. ඒ අනුව තවදුරටත් දිස්ත්‍රික්ක ලේකම් කාර්යාලයේ පවතින පුරප්පාඩු සඳහා රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශය යටතේ වන සංවර්ධන නිලධාරීන් මඟින් සම්පූර්ණ කර ගැනීමත් අනතුරුව තවදුරටත් පුරප්පාඩු සඳහා වෙනත් අමාත්‍යාංශ / ආයතන මඟින් ස්ථාන මාරු කර ගැනීමට අදාලව කටයුතු කළ යුතුය.

**03.2 පුරප්පාඩු ග්‍රාම නිලධාරී කොට්ඨාසහි වැඩ බැලීම.**

03.2.1මේ වන විට ග්‍රාම නිලධාරී කොට්ඨාස 518 පමණ ප්‍රජා සවිබලගැන්වීම් නිලධාරී පුරප්පාඩු පෙන්නුම් කරයි. මෙම ග්‍රාම නිලධාරී කොට්ඨාස සඳහා ප්‍රජා සංවර්ධන සහා පිහිටුවීම් කටයුතුවලට එය බාධාවක්ව පවතින බැවින් ස්ථිර නිලධාරියෙකු අනුයුක්ත කරන තෙක් සුදුසු නිලධාරියෙකු වැඩ බැලීමට පත් කිරීමට අවශ්‍යව ඇත. එබැවින් වැඩ බැලීම සඳහා විධිමත් අනුමැතිය ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙතින් ලබාගැනීම සඳහා අදාල නිර්දේශයන් මෙම අමාත්‍යාංශය වෙත යොමු කල යුතුය. නමුදු පොළොන්නරුව හා නුවරඑළිය දිස්ත්‍රික්ක සඳහා පමණක් පුරප්පාඩු ග්‍රාම නිලධාරී කොට්ඨාසයන්හි වැඩ බැලීමට යෝජිත නිලධාරීන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ ආවරණ අනුමැතියට යටත්ව පත් කිරීමට කටයුතු කල හැකි අතර විධිමත් අනුමැතිය සඳහා ලේඛන මාස 02ක් ඇතුළත අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කල යුතුය.

**03.3 අභ්‍යන්තර ස්ථාන මාරු**

03.3.1 ප්‍රජා සවිබලගැන්වීම් නිලධාරීන් සඳහා අභ්‍යන්තර ස්ථාන මාරු පටිපාටියක් සැකසීමට කටයුතු කරනු ලැබේ. එතෙක් මාගේ චක්‍රලේඛ අංක 04/2025හි අංක 4 ප්‍රකාරව කටයුතු කල හැකි වේ.

03.3.2 මේ වන විට ග්‍රාම නිලධාරී කොට්ඨාස, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්ට අනුයුක්ත කර ඇති නිලධාරීන්, ග්‍රාමීය සංවර්ධන කාර්යාංශයෙන් පිටතට ස්ථාන මාරු කිරීමේදී විනය හේතුමත හා නිලධාරියාගේ පාලනයෙන් තොරවූ සුවිශේෂී ඉල්ලීම් සඳහා පමණක් හැර වෙනත් හේතු මත ස්ථාන මාරු වන්නේ නම් අනුප්‍රාප්තිකයකු සහිතව පමණක් ඔබගේ නිර්දේශ ලබා දීමට කටයුතු කළ යුතුය.

03.3.3 උක්ත අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව එවකට ආර්ථික සංවර්ධන නිලධාරීන් ලෙස අනුයුක්තව සිටි සංවර්ධන නිලධාරීන් මේවන විට මෙම අමාත්‍යාංශයට ප්‍රජා සවිබලගැන්වීම් නිලධාරීන් ලෙස අනුයුක්තව ඇති නමුදු විවිධ හේතුමත අනුයුක්ත ලිපි ලබා ගැනීමෙන් තොරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල / දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සිටින නිලධාරීන් සඳහා වැටුප් හා දීමනා ලබාදීම එම වැය ශීර්ෂයෙහි අදාල වැඩසටහන මඟින් තවදුරටත් සිදුකල නොහැකි බැවින් එවැනි නිලධාරීන් වේනම් ඔවුන් රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත අනුයුක්ත කිරීම සඳහා එම නිලධාරීන්ගේ තොරතුරු ඇමුණුම 1 ආකෘතිය අනුව සම්පූර්ණ කර මෙම අමාත්‍යාංශය වෙත දැනුම්දීමට කටයුතු කල යුතුය.

**03.4 විදේශීය නිවාඩු**

03.4.1. ආයතන සංග්‍රහයේ 12 පරිච්ඡේදයේ 16.5 වගන්තිය ප්‍රකාරව රැකියාවන් සඳහා විදේශගත වන නිලධාරීන්ගේ ගිවිසුම් අත්සන් කිරීම අදාල ප්‍රාදේශීය ලේකම් හෝ දිස්ත්‍රික් ලේකම් විසින් සිදු කර එවීමට කටයුතු කල යුතුය.

**03.5 දීමනා ලබාදීම**

03.5.1. ප්‍රජා සවිබලගැන්වීම් නිලධාරීන් සඳහා කාර්යාල දීමනා හා පරිවර්තිත ගමන් වියදම් සඳහා වන දීමනා ගෙවීම ඉදිරියේදී සංශෝධනය කරන අතර, එතෙක් පවතින දීමනා අනුමැතියන් පරිදි ගෙවීම් කටයුතු සිදු කල හැකිය.

### 03.6 කාර්යාල වේලාව

03.6.1 ග්‍රාම නිලධාරී කොට්ඨාස සඳහා අනුයුක්ත ප්‍රජා සවිබලගැන්වීම් නිලධාරීන් මහජන දිනය වන සඳුදා දින ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට වාර්තා කල යුතුය. අඟහරුවාදා බ්‍රහස්පතින්දා තම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ජනතාව මුණගැසීම පෙ.ව .8.30 සිට ප.ව. 4.15 දක්වා තම කාර්යාලයේ රැඳී සිටිය යුතුය. සෙසු දිනවලදී ක්ෂේත්‍ර රාජකාරිවල යෙදිය යුතුවේ.

03.6.2 කාර්යාලගත නිලධාරීන් ක්ෂේත්‍ර රාජකාරිහි නිරත වන අවස්ථාවලදී පූර්ව අනුමැතිය ලබාගැනීම හෝ කාර්යාලයට පැමිණීම සටහන් කර විධිමත් බැහැර අනුමැතිය ලබාගැනිමෙන් පසු ක්ෂේත්‍ර රාජකාරිවල නිරතවිය යුතුය. වාර්ෂික නිවාඩු වාර්තා සකස් කිරීමේදී උක්ත පරිදි ක්‍රියා කිරීම සැලකිල්ලට ගත යුතුය.

### 03.7 ඉදිරි හා කළ වැඩසටහන් ඉදිරිපත් කිරීම.

සියළුම ප්‍රජා සවිබලගැන්වීම් නිලධාරීන් මාසික ඉදිරි හා කළ වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් බලය පවරනු ලබන නිලධාරියෙකු වෙත ඉදිරිපත් කොට අනුමත කරගත යුතුය. ඉදිරි වැඩසටහන් ඊට පෙර මස අවසන් සිකුරාදා දිනට ප්‍රථමවද කළ වැඩසටහන් ආරම්භක මාසයේ මුල් සිකුරාදා දිනට ප්‍රථමව ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතුය. මෙම ලේඛන එම නිලධාරීන්ගේ කාර්යාලයන්හි විධිමත්ව පවත්වාගෙන යන බවට ප්‍රාදේශීය ලේකම් / දිස්ත්‍රික් ලේකම්ගේ අධීක්ෂණයට ගත යුතුය.

### 03.8 නිලධාරී දත්ත පද්ධතියක් පවත්වා ගැනීම.

මෙම අමාත්‍යාංශය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි 15,000 කට ආසන්න සංවර්ධන නිලධාරී පිරිසක් සේවය කරන බැවින් එම නිලධාරීන්ගේ දත්ත පද්ධතියක් ඉදිරියේදී සැකසීමට කටයුතු කරන අතර එතෙක් මෙම නිලධාරීන්ගේ නිශ්චිත සේවා ස්ථාන / නිවාඩු / සේවය හැරයාම් / වැඩ තහනම් කිරීම් / ඉල්ලා අස්වීම් පිළිබඳව තොරතුරු Excel ලේඛනයක් මඟින් ගොනුවක මාසිකව යාවත්කාලීන කරමින් පවත්වා ගෙන යාමටත් කටයුතු කළ යුතු අතර කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවට යොමු කිරීමට අදාල සේවක කාර්තු වාර්තාවේ පිටපතක් මෙම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමටද කටයුතු කළ යුතුය.

### 03.8 වෙනත්

03.8.1 කාර්යාල නාම පුවරු සැකසීම, කාර්යාල උපකරණ, නිල මුද්‍රාව පිළිබඳව ග්‍රාම සංවර්ධන කාර්යාංශය මඟින් ඉදිරියේදී උපදෙස් ලබාදෙන ඇත.

03.8.2 ප්‍රජා සවිබලගැන්වීම් නිලධාරීන් තම ආයතන කටයුතු සඳහා අමාත්‍යාංශය වෙත පැමිණීම අත්‍යාවශ්‍ය නොවන අතර, සුවිශේෂී තත්ත්ව යටතේ අමාත්‍යාංශය වෙත පැමිණීම බදාදා දින පමණක් සිදු කල හැකිය. එම නිලධාරීන්ගේ ආයතනික කටයුතු සඳහා ග්‍රාමීය සංවර්ධන කාර්යාංශයේ අධ්‍යක්ෂ පාලන වෙතින් විමසීම් සිදු කල හැකිය. දුරකථන අංක 011 2887831 / 011 2877377

එච්.ටී.ආර්. නාලිකා පියසේන

ලේකම් (වැ.බ.)

පිටපත් :

1. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
2. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්
3. අතිරේක ලේකම්, ප්‍රජාශක්ති ලේකම් කාර්යාලය
4. අධ්‍යක්ෂ ජනරාල්, ග්‍රාමීය සංවර්ධන කාර්යාංශය
5. අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

} කරු.දැ.ගැ.ස. හා අ.ක.ස.

ඇමුණුම

ප්‍රජා සවිබලගැන්වීම් නිලධාරීන් අනුයුක්ත කිරීමෙන් පසු රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත අනුයුක්ත කල යුතු අතිරික්ත නිලධාරීන්ගේ නාම ලේඛණය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | නිලධාරියාගේ නම | සංවර්ධන නිලධාරී පත්වීම් දිනය | සංවර්ධන නිලධාරී පත්වීම් අංකය | ජාතික හැඳුනුම්පත් අංකය | දුරකථන අංකය |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |

සකස් කලේ : පරීක්ෂා කලේ : අනුමත කලේ :

* ඉහත සඳහන් ආකෘති පත්‍රය සම්පූර්ණ කර 2026.02.05 දිනට ප්‍රථමව dir.rdb.mrsc@sltnet.lk විද්‍යුත් ලිපිනය ඔස්සේ යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.